**මාධ්‍ය නිවේදනයයි**

2008-07-08

Visit our web site
www.tisrilanka.org

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of integrity

28/1, Bullers Lane, Colombo 07
Tel/Fax: 0112-501474, 0112-592287
Email: tisl@sltnet.lk
Web: http://www.tisrilanka.org

# පාර්ලිමේන්තු මූල්‍ය අධීක්ෂණ කාරක සභා නොපමාව පත් කරන ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රජයට බලකර සිටී.

ජනාධිපතිවරයා විසින් මෑතකදී සිදුකරන ලද පාර්ලිමේන්තුව කල්දැමීමත් සමග අහෝසි වූ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව (COPE) සහ රාජ්‍ය ගිණුම් කාරක සභාව (PAC) යන මූල්‍ය කාරක සභා නැවත පත් කිරීමට මේ වන තෙක් අවශ්‍ය පියවර නොගෙන ඇත්තේ මන්දැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය පාර්ලිමේන්තුවෙන් විමසා සිටී.

මූල්‍ය අධීක්ෂණය සහතික කරනු වස්, තවදුරටත් පමා කිරීමකින් තොරව එම මූල්‍ය කාරක සභා පත් කිරීම මහජන මුදල්වල භාරකරු වන පාර්ලිමේන්තුව විසින් කළ යුතුව ඇතැයි ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය අවධාරණය කර සිටියි.

ජගත් යහපාලන භාවිතයන් ප්‍රකාරව ඵලදායී මූල්‍ය කාරක සභා පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ස්වාධීන වටපිටාවක් සහතික කිරීම පාර්ලිමේන්තුවේ වගකීමකි. රජයේ විධායක අංශය ලෙස සැලකෙන ඇමතිවරුන් හා නියෝජ්‍ය ඇමතිවරුන් අධීක්ෂණ කාරක සභා තුළ සේවය නොකළ යුතුය යන්න ද යහපාලනයේ ප්‍රධාන මූලධර්මයක් ලෙස සැලකේ. සම්මුතියක් බවට වර්ධනය වී ඇති තවත් මූලධර්මයක් වන්නේ විපක්ෂයේ ස්වාධීන මන්ත්‍රීවරුන් මෙම අධීක්ෂණ කාරක සභාවල නායකත්වය හෙබවිය යුතු බවයි. පාර්ලිමේන්තු සැසිවාරය කල්තැබීමත් සමග COPE හා PAC ඇතුළු සියලු කාරක සභාවල පැවැත්ම අහෝසි වූ අතර දැනට එම සියලුම කාරක සභා පවතිනුයේ අකර්මණ්‍ය තත්ත්වයකය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වරින් වර පිල් මාරු කිරීමේ වර්තමාන දේශපාලන වාතාවරණය තුළ, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ අසුන්ගෙන සිටින මන්ත්‍රීවරයෙක් විසින් (අයත් පක්ෂය කුමක් වුවත්) මෙම කාරක සභා මෙහෙයවීම වඩාත් සුදුසු බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විශ්වාසයයි.

එබැවින් තවදුරටත් පමා කිරීමකින් තොරව මෙම කාරක සභා සඳහා සුදුසු සාමාජිකයන් පත් කරන ලෙස ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය රජයට බලකර සිටී.